00016

**ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය**
**අධ්‍යාපන පීඨය**
**පෙර පාසල් අධ්‍යාපනය පිළිබඳ උසස් සහතික පත්‍ර වැඩසටහන - 2014/2015**
**අවසාන පරීක්ෂණය - 2015**
**මුල් ළමාවියේ සමායෝගී වීමේ ගැටළු – ESC2221**
**කාලය : පැය (03) තුනයි.**

---

**දිනය - 2015 දෙසැම්බර් මස 05 වන දින** **වේලාව - ප.ව.01.30 - ප.ව.04.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරාගනු ලබන ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

**<u>1 වන කොටස</u>**

01. සමායෝගී ගැටළු සහිත ළමයින් පෙන්වන චර්යා පහක් (05) ලැයිස්තු ගත කරන්න.

02. ඊඩිපස් සංකීර්ණය සහ ඉලෙක්ට්‍රා සංකීර්ණය යන්නෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?

03. හැවිග්හර්ට්ස් විසින් ඉදිරිපත් කරන ලද මුල් ළමාවියට අදාල සංවර්ධනාත්මක කාර්යයන් පහක් (05) දක්වන්න.

04. ළමයෙකුගේ සංවර්ධනය මත අධික ලැජ්ජාශීලීත්වයේ ප්‍රතිවිපාක තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

05. ප්‍රචණ්ඩකාරී චර්යාවන් අවම කරගත හැකි ආකාර තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

06. ළමයින් තුළ ප්‍රචණ්ඩකාරී හැසිරීම් මඟහැරවීම සඳහා කිසිදු චිත්තවේගික හානියකින් තොරව 'දඬුවම' ධනාත්මක ආකාරයෙන් භාවිත කළ හැකිය.

    දඬුවම එසේ භාවිත කළ හැකි ආකාර දෙකක් උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

07. පුද්ගලයෙකුගේ සංවර්ධනයෙහි ලා ළදරු අවධිය තුළ මව සමඟ ඇති කර ගන්නා මුල් කාලීන බැඳීමේ වාසි තුනක් (03) කෙටියෙන් පැහැදිලි කරන්න.

08. චර්යා හැඩගැස්වීමට අදාළ ශිල්ප ක්‍රම දෙකක් (02) කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 5 x 8 = 40)

## 2 වන කොටස

09. i. ළමයින්ගේ සමායෝගී ගැටළු සඳහා බලපාන පවුල ආශ්‍රිත සාධක පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. ළමයින් තුළ සමායෝගී දුෂ්කරතා අවම කිරීම සඳහා ඔවුන් සමග ධනාත්මක ආකාරයෙන් කටයුතු කරන්නේ කෙසේද යන්න සම්බන්ධව පෙරපාසල් ගුරුවරියක ලෙස ඔබ දෙමාපියන්ට උපදෙස් දෙන්නේ කෙසේ ද? (ලකුණු 10)

10. ළමයින් විසින් අත්දකින මනෝ සමාජීය සංවර්ධනය හා ඒ ඒ අවධියට අදාළ අර්බුද පිළිබඳ අවධි මාලාවක් එරික් එරික්සන් විසින් යෝජනා කර ඇත.

i. මනෝ සමාජීය සංවර්ධනයට අදාළ මුල් අවධීන් තුන තුළ දී ළමයින් අත්දකින අර්බුද පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. ළමයින් තුළ පවතින මෙම අර්බුද වඩා හොඳ ආකාරයෙන් විසඳා ගැනීම සඳහා දෙමාපියන්ට උදව් කළ හැක්කේ කෙසේදැයි කෙටියෙන් සාකච්ජා කරන්න. (ලකුණු 10)

11. i. නිදහසට හා කැමැත්තට ඉඩදෙන දෙමාපිය ශෛලිය සහ දැඩි පාලනයක් යටතේ ළමයින් හදා වඩා ගන්නා දෙමාපිය ශෛලිය අතර වෙනස්කම් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. වර්තමාන සංකීර්ණ සමාජය තුළ ළමයින් ගුණාත්මක දෙමාපිය රැකවරණයක් ලබා ගැනීම සම්බන්ධ අවදානමකට මුහුණ පා ඇත්තේ මන්දැයි උදාහරණ ආශ්‍රයෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10)

12. i. බාල ළමයින්ගේ සංවර්ධනය තුළ 'සෙල්ලම' යන්නෙහි වැදගත්කම පහත අංශ යටතේ පැහැදිලි කරන්න.

චාලක සංවර්ධනය

භාෂා සංවර්ධනය

සමාජ හා චිත්තවේගික සංවර්ධනය (ලකුණු 12)

ii. ළමයින්ගේ සමාජ හා චිත්තවේගික දුෂ්කරතා අවම කරලීම සඳහා 'සෙල්ලම' භාවිතා කරන ආකාරය උදාහරණ ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08)

13. i. නිරීක්ෂණාත්මක ඉගෙනුම හා ප්‍රකාරක ඉගෙනුම යන්නෙහි මූලික අදහස් පැහැදිලි කරන්න. (ලකුණු 10)

ii. උක්ත අදහස් පිළිබඳ සැලිකිලිමත් වෙමින් බාල ළමයින්ගේ චර්යා වෙනස් කිරීම සඳහා නිරීක්ෂණාත්මක ඉගෙනුම ප්‍රාථමික පන්ති කාමර තුළදී භාවිතා කළ හැක්කේ කෙසේදැයි කෙටියෙන් සාකච්ජා කරන්න. (ලකුණු 10)

14. පහත ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. සම්භාව්‍ය ආරෝපණ න්‍යාය මගින් අලුත් සම්බන්ධතා ඉගෙනීම

ii. ආයතනගත කිරීම

iii. අවධාන දුෂ්කරතා සහිත ළමයින් සමඟ කටයුතු කිරීම

iv. සමායෝගී ගැටළු සඳහා බලපාන පාසල ආශ්‍රිත සාධක

(ලකුණු 10 x 2 = 20)

හිමිකම් ඇවිරිණි.

**THE OPEN UNIVERSITY OF SRI LANKA**

**FACULTY OF EDUCATION**

**FINAL EXAMINATION – 2015**

**ADVANCED CERTIFICATE IN PRE-SCHOOL EDUCATION PROGRAMME**

**ESC2221– ADJUSTMENT PROBLEMS IN EARLY CHILDHOOD**

**DURATION – THREE (03) HOURS.**

| Date: 05th December 2015 | Time: 1.30 p.m. – 4.30p.m. |
|---|---|

Answer all questions in **Part I** & three (03) questions from **Part II**.

## PART I

01. List out **five (05)** behaviours shown by children with adjustment problems.

02. What do you mean by Oedipus complex and Electra complex?

03. Indicate **five (05)** developmental tasks in early childhood presented by Havighurst.

04. Briefly explain **three (03)** consequences of excessive shyness on child development.

05. Briefly explain **three (03)** ways of eliminating aggressive behaviours in children.

06. 'To eliminate negative behaviours of children, punishment could be given in a positive manner without any emotional harm'. Explain **two (02)** such ways with examples.

07. Briefly explain **three (03)** advantages of early attachment with the mother during the infant stage for the development of an individual.

08. Briefly explain **two (02)** techniques of behaviour modification.

(5 x 8 = 40 marks)

000

## PART II

09. i. Explain family related factors that influence adjustment difficulties of children.

(10 marks)

ii. As a teacher how do you advise the parents on how to deal with their children in a positive manner to minimize the adjustment difficulties in their children?

(10 marks)

10. Eric Erikson proposed several stages of psychosocial development and crisis experienced by children at each stage.

i. Describe the crisis experienced by children during Erikson's first **three(03)** stages of psychosocial development.

(10 marks)

ii. Discuss briefly, how parents can help the children to resolve these crisis in healthy manner.

(10 marks)

11. i. Explain the differences between permissive indulgent parenting style and authoritarian parenting style.

(10 marks)

ii. Citing examples explain why do the children are at risk of not having quality parenting care in current complex society.

(10 marks)

12. i. Explain the importance of play in the development of following aspects of young children.

Motor development
Language development
Social and emotional development

(12 marks)

ii. Citing examples explain how do you use play to eliminate social and emotional difficulties in children?

(08 marks)

13. i. Explain the basic ideas of observational learning and Operant Conditioning Learning.

(10 marks)

ii. Considering the basic ideas, briefly discuss how observational learning could be practiced in primary classrooms to change the behaviour of young children.

(10 marks)

14. Writ short notes of any **two (02)** of the following.

Learning new associations through classical conditioning

Institutionalization.

Dealing children with attention difficulties

School related factors that influence adjustment problems.

(10 x 2 = 20 marks)

*-Copyrights reserved -*